**ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව - 2022**

**----------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ("කොමිෂන් සභාව") 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.
**කොමිෂන් සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව මා දරන්නා වූ මතය වේ.**

### 1.2 මතය සඳහා පදනම

**ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.**

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

**මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ..**

**මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී, කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය කොමිෂන් සභාවේ ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.**

**කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.**

**2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.**

**1.4** විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද:

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම..

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත;

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කොමිෂන් සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- **යම් අදාළ ලිඛිත නීතියකට හෝ කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, කොමිෂන් සභාවේ ක්‍රියා කර ඇති බව;**

- **සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව; සහ**

- **සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,.**

## 1.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොමැතිවීම

| **නොසැපයූ විගණන සාක්ෂි** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ.) රක්ෂණයේ හර මූලධර්ම (ICPs) යනු ජාත්‍යන්තර රක්ෂණ අධීක්ෂකවරුන්ගේ සංගමය (IAIS) මගින් සකස් කරන ලද ගෝලීය වශයෙන් පිළිගත් මූලධර්ම රාමුවකි. රක්ෂණ නියාමකයින්ගේ නියාමන සහ අධීක්ෂණ කාර්යයේ ගුණාත්මකභාවය තක්සේරු කිරීමේ දී සහ රට තුළ රක්ෂණ ක්ෂේත්‍රය සඳහා රෙගුලාසි හඳුන්වාදීමේ රාමුවක් ලෙස භාවිතා කිරීමේ දී එම මූලධර්ම ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. ජාත්‍යන්තර රක්ෂණ අධීක්ෂකවරුන්ගේ සංගමයේ (IAIS) සාමාජිකයෙකු වශයෙන් මෙම කොමිෂන් සභාව මගින් 2022 වර්ෂය සඳහා සාමාජික ගාස්තුව ලෙස රු. 5,999,664 ක් ගෙවා තිබුණි. කොමිෂන් සභාව විසින් රක්ෂණයේ මූලික මූලධර්මවලට අනුකූල වන ආකාරය හඳුනා ගැනීම සඳහා 2021 වර්ෂයේ විගණනයේදී තොරතුරු ඉල්ලා තිබුණි. නමුත් ඉල්ලා සිටි තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | රක්ෂණයේ හර මූලධර්ම 1,2, 9, 10 තක්සේරුව සඳහා සම්පූර්ණයෙන්ම නිරීක්ෂණ සිදු කර ඇත. ජාත්‍යන්තර රක්ෂණ අධීක්ෂකවරුන්ගේ සංගමය (IAIS) මගින් මේ වන විට රක්ෂණයේ හර මූලධර්ම 25ක් හඳුනාගෙන ඇත.<br><br>රක්ෂණ පනතට සංශෝධන සිදු කිරීම සඳහා අධිකරණ අමාත්‍යාංශය විසින් පිහිටුවන ලද කමිටුවක් මගින් සියලුම ICPs පිළිබඳ සමාලෝචනයක් සිදු කෙරේ. සමාලෝචන අවසන් වූ පසු තොරතුරු බෙදා ගනු ලැබේ.<br><br>කොමිෂන් සභාව විසින් මූලධර්ම 1-4 පිළිබඳ අදහස් සහ ඉදිරිපත් කිරීම් කමිටුව වෙත ලබා දී ඇත. කමිටුව විසින් ඒකාබද්ධ කරන ලද මූලධර්ම සමාලෝචනය කිරීමේ ක්‍රියාවලියක යෙදී සිටී. | කළමනාකාරිත්වය විසින් විගණනය මගින් ඉල්ලා සිටින තොරතුරු නියමිත වේලාවට විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය.. |
| (ආ.) කොමිෂන් සභාව විසින් 2020 වර්ෂය දක්වා ඒ ඒ වර්ෂය සඳහා කොමිෂන් සභාවේ අරමුදල්වල අතිරික්තය රක්ෂණ ඔප්පුහිමියන් සුරැකීමේ අරමුදලට මාරු කර තිබුණි. කෙසේ වුවද, 2021 වර්ෂයේදී මෙම ප්‍රතිපත්තිය හදිසියේ වෙනස් කර තිබුණු අතර කොමිෂන් සභාවේ අරමුදල්වල අතිරික්තය සමුච්චිත අරමුදල් ලෙස ඉදිරියට ගෙන ගොස් තිබුණි. කෙසේ වුවද, මේ සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ අනුමැතිය විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | 2023 අප්‍රේල් 20 වැනි දින පැවති පළමු විගණන කමිටු රැස්වීමේදී පහත සඳහන් නිර්දේශ කොමිසම වෙත ඉදිරිපත් කර ඇත:<br><br>1. වෙන් කරන ලද අරමුදල් දෙකක් ලෙස ඉදිරියට පවත්වාගෙන යාම සහ සමුච්චිත අරමුදල ලෙස කොමිෂන් සභාවේ අරමුදලේ අතිරික්තය රඳවා ගැනීම.<br><br>2. අවශ්‍ය වුවහොත් කොමිෂන් සභාවේ වියදම් (පුනරාවර්තන සහ ප්‍රාග්ධනය) ආවරණය කිරීම සඳහා රක්ෂණය ඔප්පු | වාර්තාකරණ රාමුවේ විධිවිධාන අනුව සහ සුදුසු අධිකාරියක් සහිතව ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස් කළ යුතු වන්නේය.. |

හිමියන්ගේ ආරක්ෂණ අරමුදලෙහි වාර්ෂික පොලී ආදායමෙන් 20%ක උපරිම ප්‍රතිශතයක් කොමිෂන් සභා අරමුදලට මාරු කිරීම.

කොමිෂන් සභාව 2023 අගෝස්තු 03 වැනි දින පැවති එහි 237 වැනි රැස්වීමේදී ඉහත විගණන කමිටු නිර්දේශ අනුමත කරන ලදී.

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම.**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ.) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත | රක්ෂණය ඔප්පු දරන්නන්ගේ ආරක්ෂණ අරමුදලේ අතිරික්තය සඳහා කොමිෂන් සභාව විසින් බදු ගෙවිය යුතුය. නමුත් කොමිසම 2018 සිට ආදායම් බදු ගෙවා නොමැත. එම නිසා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් 2018/19 සිට 2022/23 දක්වා තක්සේරු වර්ෂ සඳහා ආදායම් බදු නොගෙවීම සම්බන්ධයෙන් දඩ මුදලක් සහ පොළී ගණනය කර තිබුණි. 2022 දෙසැම්බර් 31 දිනට නොගෙවූ සම්පූර්ණ බදු වගකීම රු. 909,009,476 කි. | රක්ෂණ ඔප්පු දරන්නන්ගේ ආදායම් බදු වගකීම ලෙස මේ දක්වා ගෙවා ඇති මුදල රු. 1,265,453,413 කි. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් 2018/19 සහ 2019/20 වසර සඳහා ආදායම් බදු ගෙවීම ප්‍රමාද කිරීම හේතුවෙන් පොලී වශයෙන් රු. 153,621,910 සහ දඩ වශයෙන් රු. 62,509,715 ක් අයකර ඇත.<br><br>කොමිසම විසින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙතින් දඩය සහ පොලී ඉවත් කරන ලෙස ඉල්ලා ඇත. 2023 ඔක්තෝම්බර් 25 දින දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙතින් ගෙවීම් ඉල්ලා කොමිසම වෙත දැන්වීමක් ලැබී ඇති බැවින්, දැනට පවතින 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ නිදහස් කිරීමට ප්‍රතිපාදන නොමැති බැවින් බදු උපදේශකයාගේ උපදෙස් ලබාගෙන පොලී සංරචකය වහාම ප්‍රේෂණය කරන ලෙස විගණන කමිටුව උපදෙස් දී ඇත.<br><br>තවද, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ 2023 ඔක්තෝම්බර් 31 දිනැති ලිපිය මගින් දන්වා ඇත්තේ, දඩුවම සඳහා අඩු කිරීම සලකා බැලීම සඳහා 2018/19 සහ 2019/20 තක්සේරු වර්ෂ සඳහා | නිරාකරණය නොවූ බදු කටයුතු බදු අධිකාරීන් සමඟ කටයුතු කර නිරාකරණය කර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | එකතු කරන ලද මුළු පොලී ගෙවීම සිදුකරන ලෙස සඳහන් කර ඇත. | |
| (ආ.) 2021 රාජ්‍ය ව්‍යාපාර ව්‍යවසායන් සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශවල මාර්ගෝපදේශ 2.2.2 (a.) (i.) | කොමිෂන් සභාවේ රැස්වීම්වලදී නිසි ක්‍රියාමාර්ග අනුගමනය කරන බවට සභාපතිවරයා සහතික විය යුතුය. කෙසේ වෙතත්, 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්ත නියාමන පනතේ 4 (3) ඡේදය සහ පළමු උපලේඛනය අනුව රැස්වීම්වල කටයුතු සඳහා ලේඛනගත ප්‍රතිපත්තියක් විගණනය වෙත ලබාදී නොමැත. | පනත අනුව කොමිෂන් සභා රැස්වීම් පවත්වනු ලැබේ. පනතේ පළමු උපලේඛනයේ 8 (1) ඡේදය මගින් කොමිසමේ ක්‍රියාදාමයන් විශේෂයෙන් සඳහන් කර ඇති අතර එම අවශ්‍යතා කොමිසම විසින් අනුගමනය කරනු ලැබේ.<br><br>2022 අගෝස්තු 16 වැනි දින පැවති 223 වැනි රැස්වීමේදී ලිපි ලේඛන ඉදිරිපත් කිරීම සහ රැස්වීම් වාර්තා ලබා ගැනීම සඳහා වූ ක්‍රියා පටිපාටි අත්පොතක් කොමිෂන් සභාව විසින් අනුමත කර ඇති අතර එය ක්‍රියාත්මකව පවතී. | ලේඛනගත ප්‍රතිපත්තිය විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (ඇ.) 2021 රාජ්‍ය ව්‍යාපාර ව්‍යවසායන් සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශවල මාර්ගෝපදේශ 2.2.2 (b) (vi.) | කොමිෂන් සභාව අධ්‍යක්ෂ ජනරාල් සමඟ කාර්ය සාධන ගිවිසුමකට එළඹිය යුතු අතර එය උපායමාර්ගික සැලැස්මේ පිළිබිඹුවක් වන අතර, ඊට අනුකූලව අධ්‍යක්ෂ ජනරාල්ගේ කාර්ය සාධනය වාර්ෂිකව ඇගයීමට ලක් කළ යුතු අතර ප්‍රසාද දීමනා ඇතුළු දිරිගැන්වීම් තීරණය කළ යුතුය.. කෙසේ වෙතත්, කොමිසම අධ්‍යක්ෂ ජනරාල් සමඟ කාර්ය සාධන ගිවිසුමකට එළඹ නොතිබුණි. තවද, අධ්‍යක්ෂ ජනරාල්ගේ වාර්ෂික කාර්ය සාධන ඇගයීම කොමිෂන් සභාව විසින් සිදු කර නොමැති බව නිරීක්ෂණය විය. ඒ වෙනුවට, එය සභාපතිවරයා විසින් පමණක් සිදු කර සමාලෝචිත වර්ෂය සඳහා කාර්ය සාධන දිරි දීමනා ගෙවා ඇත. කොමිසමේ බලගතු තනතුරු දෙකක් අතර වගකීම් සහ වගවීම දුර්වල වීමට මෙය හේතු විය හැක. | 2023 අගෝස්තු 24 වැනි දින පැවති කොමිසමේ 238 වැනි රැස්වීමේදී අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ප්‍රධානය කාර්යසාධන දර්ශක සඳහා එකඟ විය. කාර්ය සාධනය සමාලෝචනය කර කොමිසමට වාර්තා කිරීම සඳහා කොමිෂන් සභාව විසින් කොමිෂන් සභා සාමාජිකයින්ගෙන් සමන්විත කමිටුවක් පත් කර ඇත. | අධ්‍යක්ෂ ජනරාල්ගේ ප්‍රධාන කාර්යසාධන දර්ශක තීරණය කළ යුතු අතර වගකීම් සහ වගවීම පිළිබඳ පැහැදිලි බෙදීම වැඩි දියුණු කිරීම සඳහා සමස්තයක් ලෙස කොමිෂන් සභාව විසින් කාර්ය සාධනය ඇගයීමට ලක් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ.) 2021 රාජ්‍ය ව්‍යාපාර ව්‍යවසායන් සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශවල මාර්ගෝපදේශ 2.4. | කොමිෂන් සභාවේ සාමාජිකයින් විසින් මාර්ගෝපදේශයේ ඇමුණුම II හි දක්වා ඇති ආකෘතිය භාවිතා කරමින් කොමිෂන් සභාවේ ලේකම් වෙත වාර්ෂිකව ඔවුන්ගේ සම්බන්ධතාවයන් තනි තනිව ප්‍රකාශ කළ යුතුය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය සඳහා එවැනි ප්‍රකාශයක් කොමිෂන් සභාවේ සාමාජිකයින් විසින් ප්‍රකාශයට පත් කර නොතිබුණි. | 2023 වසර සඳහා වාර්ෂික ප්‍රකාශන කොමිෂන් සභාවේ සාමාජිකයින්ගෙන් ලබාගෙන ඇත. එම අවශ්‍යතාවය ඉදිරියේදී අඛණ්ඩව සිදු කරනු ඇත. | වාර්ෂික ප්‍රකාශ සාමාජිකයින් විසින් වාර්ෂිකව කොමිෂන් සභාවේ ලේකම් වෙත ඉදිරිපත් කළ යුතුය. |
| (ඉ.) 2021 රාජ්‍ය ව්‍යාපාර ව්‍යවසායන් සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශවල මාර්ගෝපදේශ 2.6 | අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයා ප්‍රධාන වශයෙන් මණ්ඩලයේ වගකීම් ඉටුකිරීම සම්බන්ධයෙන් මඟ පෙන්වීම සඳහා වගකිව යුතු අතර, ව්‍යවස්ථාපිත අවශ්‍යතා සහ කර්මාන්තයේ හොඳම භාවිතයන්ට අනුකූලව සියලුම ක්‍රියා පටිපාටි අනුගමනය කරන බවට සහතික විය යුතු අතර මාර්ගෝපදේශයේ දක්වා ඇති අවශ්‍ය සුදුසුකම් තිබිය යුතුය. තවද, දැනටමත් වෙනත් කාර්යයක නිරතව සිටින කිසියම් සේවකයෙකු අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් ලෙස පත් නොකළ යුතු අතර අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු ලේකම් ලෙසද කටයුතු කළ යුතුය. නමුත් කොමිසමට සුදුසුකම් ලත් ලේකම්වරයෙක් නොමැත. මාර්ගෝපදේශයට පටහැනිව ඔවුන්ගේ ස්ථිර වගකීම්වලට අමතරව දැනට විමර්ශන අධ්‍යක්ෂ කොමිෂන් සභාවේ ලේකම් ලෙස ක්‍රියා කරන අතර සහකාර අධ්‍යක්ෂ - නීති විගණන කමිටුවේ ලේකම්වරයා ලෙස කටයුතු කරනු ලබයි. | යෝජනා සඳහා ඉල්ලීම (RFP) ප්‍රධාන විගණන ය සමාගම් පහට යොමු කරන ලදී. යෝජනා ඉදිරිපත් කිරීමේ අවසාන දිනය 26/09/2023 වේ. කෙසේ වෙතත්, අපගේ ඉල්ලීමට ප්‍රතිචාර වශයෙන් කිසිදු යෝජනාවක් ලැබී නැත. 2023 සැප්තැම්බර් 27 වැනි දින පැවැති කොමිසමේ 239 වැනි රැස්වීමේදී මේ බව කොමිසමට දන්වා ඇති අතර, නීතිමය ආයතන, ලේකම් සහ විගණන ආයතන වෙත අයදුම්පත් කැඳවීම දීර්ඝ කරන ලෙස කොමිසමේ සාමාජිකයන් උපදෙස් දෙන ලදී. ප්‍රසම්පාදන ක්‍රියාවලිය 2023 දෙසැම්බර් 31 ට පෙර අවසන් කිරීමට බලාපොරොත්තු වේ. | කොමිෂන් සභාවට අවශ්‍ය සුදුසුකම් ඇති ලේකම්වරයෙකු මාර්ගෝපදේශයේ විධිවිධානවලට අනුව පත් කළ යුතු අතර එම ලේකම්වරයා කොමිෂන් සභාවේ අනුකමිටුවල ලේකම්වරයා ලෙස ද කටයුතු කළ යුතුය. |
| (ඊ.) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික | විධායක කාණ්ඩයේ සේවකයින් සඳහා වාහන මිලදී ගැනීම සඳහා | කොමිසම විසින් 2021 නොවැම්බර් 16 වන දින රාජ්‍ය ව්‍යාපාර | කොමිෂන් සභාවේ සේවකයින්ගේ |

| | | | |
|---|---|---|---|
| සමාජවාදී ජනරජයේ රජයේ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 7 වැනි වගන්තිය | බැංකු හරහා ණය ලබාදීමට ප්‍රතිපාදන සලසා තිබුණද, වාහන ණය රු. 1,200,000 සමාලෝචිත වර්ෂය තුළ කොමිසමේ අරමුදල්වලින් පිළිවෙළින් සියයට 4.2 ක් සහ සියයට 9 ක පොළී අනුපාතයකට රු. 600,000 ක කොටසක් සඳහා ලබා දී තිබුණි. | දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මෙහෙයුම් අත්පොතේ 2.3 වගන්තියට අනුව සකස් කරන ලද කොමිෂන් සභා අනුමත පරිපාලන අත්පොත අනුගමනය කරයි. වාහන ණය යෝජනා ක්‍රමය පරිපාලන අත්පොතෙහි කොටසකි. | ප්‍රතිලාභ තීරණය කිරීමේදී කොමිෂන් සභාව රජයේ ප්‍රතිපත්තිවලට අනුකූල විය යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 155,220,568 ක අතිරික්තයක් වූ අතර ඉකුත් වර්ෂයේ එයට අනුරූප අතිරික්තය රු. 86,790,315ක් විය. එම නිසා, මූල්‍ය ප්‍රතිඵලයේ රු. 68,430,253 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික ගාස්තු සහ අලුත් කිරීමේ ගාස්තු ආදායම රු. 35,295,181 කින් සහ පොලී ආදායම රු. 46,211,898 කින් වැඩිවීම හේතු විය.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

| විස්තරය | මුදල (රු.) | | | | වෙනසේ ප්‍රතිශතය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2022 | 2021 | 2020 | 2019 | 2022 | 2021 | 2020 | 2019 |
| **ආදායම** | | | | | | | | |
| ප්‍රදාන හඳුනා ගැනීම | - | - | 2,905,041 | 2,324,391 | - | -100% | 25% | 20% |
| මූල්‍ය අංශ නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය මගින් ලැබුණු ආදායම | 750 | 255,150 | 12,344,401 | 81,620,094 | -100% | -98% | -85% | - |
| ප්‍රතිමිලදී ගැණුම් සහ කෙටිකාලීන ගිණුමේ පොළිය | 16,437,636 | 6,893,783 | 479,514 | 3,698,834 | 138% | 1,338% | -87% | 9,976% |
| භාණ්ඩාගාර බැඳුම්කර ආයෝජනය මත පොළිය | - | - | 33,151,511 | 92,882,074 | - | - | -64% | -2% |
| ස්ථාවර තැන්පතු මත පොළිය | 1,231,844,234 | 515,764,257 | 588,341,378 | 477,484,713 | 139% | -12% | 23% | 33% |
| **වියදම්** | | | | | | | | |
| කාර්ය මණ්ඩල පිරිවැය | 127,680,340 | 127,134,065 | 109,096,963 | 112,323,915 | 0.5% | 17% | -3% | 42% |
| කොමිෂන් සභා රැස්වීම් සඳහා සහභාගී වීමේ දීමනා | 1,754,354 | 1,384,859 | 865,972 | 540,000 | 27% | 60% | 60% | 2% |
| කාර්ය මණ්ඩල සුබසාධනය | 867,855 | 4,459,324 | 2,038,778 | 841,693 | -81% | 119% | 142% | -28% |
| කාර්ය මණ්ඩලය සඳහා වෛද්‍ය රක්ෂණය | 2,785,293 | 2,328,894 | 2,001,327 | 1,615,932 | 20% | 16% | 24% | 45% |
| කාර්ය මණ්ඩල පුහුණුව දේශීය සහ දායක මුදල් | 1,168,025 | 921,188 | 401,492 | 1,610,639 | 27% | 129% | -75% | 27% |
| ලබා නොගත් නිවාඩු සඳහා මුදල් ගෙවීම | 744,985 | 1,796,425 | 1,673,310 | 1,218,344 | -59% | 7% | 37% | 77% |
| මුද්‍රණ සහ ලිපිද්‍රව්‍ය | 1,560,693 | 2,764,004 | 2,413,783 | 3,406,080 | -44% | 15% | -29% | 106% |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| මහජනතාව දැනුවත් කිරීම | 8,570,966 | 1,814,843 | 1,459,568 | 9,834,508 | 372% | 24% | -85% | 309% |
| කාර්යාල උපකරණ නඩත්තුව ඉලෙක්ට්‍රොනික දත්ත සැකසීම සහ වෙනත් | 2,969,581 | 2,103,839 | 3,298,073 | 2,107,863 | 41% | -36% | 56% | 21% |
| අධ්‍යක්ෂවරුන්ගේ වාහන දීමනාව | 4,487,603 | 4,570,890 | 3,166,986 | 3,246,712 | -2% | 44% | -2% | 4% |
| අධ්‍යක්ෂවරුන්ගේ ඉන්ධන දීමනාව | 3,364,460 | 1,356,590 | 1,030,514 | 1,066,755 | 148% | 32% | -3% | 6% |

## 2.3 අනුපාත විශ්ලේෂණය

පසුගිය වර්ෂ පහ සඳහා කොමිෂන් සභාව සහ කර්මාන්තය සඳහා ගණනය කරන ලද ප්‍රධාන අනුපාත පහත දක්වා ඇති පරිදි වේ.

| **කොමිෂන් සභාව** | **2022** | **2021** | **2020** | **2019** | **2018** | **2017** |
|---|---|---|---|---|---|---|
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ වර්ධනය | 11% | 12% | 19% | 24% | 23% | 25% |
| වාර්ෂික සෙස් ආදායමේ වර්ධනය | 8% | 7% | 3% | 3% | 15% | 2% |
| සෙස් ආදායම දළ ලිඛිත වාරිකයේ ප්‍රතිශතයක් ලෙස | 0.23 | 0.23% | 0.24% | 0.25% | 0.26% | 0.29% |
| වාර්ෂික ගාස්තු ආදායමේ වර්ධනය | 8% | 5% | 3% | 33% | 19% | 13% |
| වාර්ෂික ගාස්තු ආදායම දළ ලිඛිත රක්ෂණ වාරිකයේ ප්‍රතිශතයක් ලෙස | 0.11 | 0.11% | 0.12% | 0.11% | 0.09% | 0.09% |
| **කර්මාන්තය** | | | | | | |
| දළ ලිඛිත වාරිකය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස | 1.07% | 1.38% | 1.39% | 1.27% | 1.24% | 1.19% |
| රක්ෂණ ක්ෂේත්‍රයේ මුළු වත්කම් රු. බිලියන | 947.3 | 879.8 | 789.7 | 689.6 | 606.6 | 564.9 |
| රක්ෂණ ක්ෂේත්‍රයේ මුළු වත්කම්වල වර්ධනය | 8% | 11% | 15% | 14% | 7% | 8% |
| රක්ෂණ ක්ෂේත්‍රයේ වත්කම් මූල්‍ය අංශයේ මුළු වත්කම්වල ප්‍රතිශතයක් ලෙස | 3.02% | 3.29% | 3.37% | 3.44% | 3.32% | 3.31% |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ.) කොමිෂන් සභාවේ කාර්යාලීය කටයුතු බාහිර ගොඩනැගිල්ලක දී සිදු කරන ලද අතර වඩාත් අරපිරිමැසුම්දායි ස්ථානයක් සොයා ගැනීමෙන් තොරව, 2021 වර්ෂයේ දී මෙම ගොඩනැගිල්ලේ බදු කුලිය වශයෙන් රු. 47,178,758 ක මුදලක් (2021 – රු. 44,631,663) ගෙවා තිබුණි. පසුගිය වසරට සාපේක්ෂව බදු | කොමිසම විසින් පරිශ්‍රය සඳහා පිරිවැය-ප්‍රතිලාභ විශ්ලේෂණයක් සිදු කර ඇත. පරිශ්‍රයේ පිහිටීම, ආයෝජන පිරිවැය, වයස සහ තත්ත්වය සැලකිල්ලට ගනිමින් කොමිෂන් සභාව එහි 239 වන රැස්වීමේදී වත්මන් පරිශ්‍රයේ දිගටම රැඳී සිටීමට තීරණය කර ඇත. | කොමිෂන් සභාව ඔවුන්ගේ කාර්යයන් ඉටු කිරීමට ආර්ථිකමය වශයෙන් සුදුසු ස්ථානයක් සලකා බැලිය යුතුය. |

කුලිය සියයට 6 කින් ඉහළ දමා ඇති බව නිරීක්ෂණය විය. කොමිසම වර්ග අඩි 8741 ක් කුලියට ලබාගෙන ඇති අතර කුලී සහ සේවා ගාස්තු වශයෙන් පිළිවෙලින් වර්ග අඩියකට රු. 351 ක් සහ රු.78 ක් දරා තිබුණි. තවද, ගොඩනැගිල්ලේ බදු කුලී ප්‍රතිශතය 2022 වර්ෂය සඳහා මුළු වියදමෙන් සියයට 22 ක් හෝ මුළු ආදායමෙන් සියයට 13 ක් නියෝජනය කරයි.

(ආ.) කොමිෂන් සභාව 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්ත විධිමත් කිරීමේ පනතට අනුව එහි කාර්යභාරය ඉටු කිරීමේදී මහජනතාව සමඟ සමීපව කටයුතු කළ යුතු ආයතනයක් විය යුතුය. කෙසේ වෙතත්, එහි වත්මන් පිහිටීම, සංස්කෘතිය සහ ඇතුල්වීමේ දොරවල් දැඩි ආරක්ෂක කොන්දේසි යටතේ පැවතීම අවදානමට ලක්විය හැකි සාමාන්‍ය ජනතාවට එයට ප්‍රවේශ වීම දුෂ්කර කරයි. තවද, කොමිසමේ වෙබ් අඩවිය සහ එහි සියලුම තොරතුරු (රක්‍ෂණ හිමියන්ගේ පැමිණිලි පිටුව හැර) ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් පවතින බව නිරීක්ෂණය විය. එබැවින් කොමිෂන් සභාව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV පරිච්ඡේදයේ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අනුකූලව කටයුතු කර නොතිබුණි. එබැවින් ආබාධිතයන්, තොරතුරු තාක්ෂණ සාක්ෂරතාව නොමැති පුද්ගලයින් සහ භාෂා ගැටළු ඇති පුද්ගලයින් වැනි අවදානමට ලක්විය හැකි කණ්ඩායම් සඳහා කොමිෂන් සභාවේ සේවය ලබා ගැනීම ඉතා අපහසු විය හැකි නිරීක්ෂණය විය. තවද, මෙය මහජන පැමිණිලි අධෛර්යමත් කිරීම සහ අවම කිරීම පිළිබඳ ඇඟවීමක් විය හැකි බව නිරීක්ෂණය විය.

කොමිසම විසින් පරිශ්‍රය සඳහා පිරිවැය-ප්‍රතිලාභ විශ්ලේෂණයක් සිදු කර ඇත. පරිශ්‍රයේ පිහිටීම, ආයෝජන පිරිවැය, වයස සහ තත්ත්වය සැලකිල්ලට ගනිමින් කොමිෂන් සභාව එහි 239 වන රැස්වීමේදී වත්මන් පරිශ්‍රයේ දිගටම රැඳී සිටීමට තීරණය කර ඇත. කොමිසමේ වෙබ් අඩවියේ අන්තර්ගතය ඉංග්‍රීසි භාෂාවෙන් සිංහල සහ දෙමළ භාෂාවට පරිවර්තනය කිරීමට පියවර ගෙන ඇත.

අවශ්‍ය පහසුකම් සපයා මහජනතාවට කාර්යක්ෂම සේවාවක් ලබාදීමට කොමිෂන් සභාව අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.

## 3.2 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කොමිෂන් සභාවේ සේවකයන් සඳහා ස්වයං දායක රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දීමට කොමිෂන් සභාව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. ඒ වෙනුවට, කොමිෂන් සභාව මගින් 2022 වසර සඳහා රක්ෂණ ආවරණයක් ලබා ගැනීම සඳහා සේවකයින්ගෙන් කිසිදු දායක මුදලක් ලබා ගැනීමකින් තොරව කොමිෂන් සභාවේ අරමුදල්වලින් රු.මිලියන 6.3 (2021 - රු.මිලියන 6.2) ක් වැය කර තිබුණි. කෙසේ වුවද, 2017 වර්ෂයේ දී ජාතික රක්ෂණ භාර අරමුදල මගින් අර්ධ රාජ්‍ය අංශයේ සේවකයින් සඳහා ද එක් සේවකයෙකු සඳහා මසකට රු.1000 ක දායක මුදලක් අය කරමින් අග්‍රහාර රක්‍ෂණ යෝජනා ක්‍රමය පුළුල් කර තිබුණි. වෛද්‍ය රක්‍ෂණ ආවරණය සඳහා 2022 වර්ෂය සඳහා කොමිසමේ අරමුදලින් එක් සේවකයකුට රුපියල් 132,038 ක් වැය කර ඇති බව නිරීක්ෂණය විය. | කොමිසම ආරම්භයේ සිටම කාර්ය මණ්ඩලයට ඔවුන්ගේ ප්‍රතිලාභවල කොටසක් ලෙස දායක නොවන රක්‍ෂණ ආවරණය ලබා දී ඇති අතර එය පත්වීම් ලිපිවල ඇතුළත් කර ඇත. ඒ අනුව ස්වයං-දායකත්ව ක්‍රමය පිළිගත නොහැක. | සේවකයින් සඳහා ස්වයං දායක රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දිය යුතු බව නිර්දේශ කෙරේ. |

## 3.3 ව්‍යාපෘති පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ.) මෙම ව්‍යාපෘතිය යටතේ, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ අධීක්ෂණය යටතේ ජාතික රක්ෂණ භාර අරමුදලේ (NITF) රක්ෂණ සහ ප්‍රතිරක්‍ෂණ ව්‍යාපාර වෙන් කිරීම සඳහා ඇමෙරිකානු ඩොලර් 945,450 ක් (SDR මිලියන 0.67 ක්) වෙන් කර තිබුණි. එසේ වුවද, මෙම මුදල් එම අරමුණ සඳහා භාවිතා කර නොතිබුණි. | විසර්ජන සම්බන්ධක දර්ශක සම්බන්ධයෙන් කොමිසමේ වගකීම පැන නගින්නේ ජාතික රක්ෂණ භාර අරමුදල වෙන් කිරීම සඳහා සිය යෝජනාව ඉදිරිපත් කළ පසු පමණි. කෙසේ වෙතත්, අරමුදල ඔවුන්ගේ ප්‍රතිපත්ති තීරණයට අනුව වෙන් කිරීම සඳහා වූ යෝජනාව ඉදිරිපත් කළේ නැත, එබැවින් කොමිසම මගින් සම්බන්ධීකරණයෙන් සහ බලපෑම් කිරීමේ ක්‍රියාමාර්ගවලින් මෙම කාර්යය සාක්ෂාත් කර ගත නොහැක. | ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීම සඳහා කොමිෂන් සභාව නිසි සම්බන්ධීකරණය සහ බලපෑම් කිරීමේ ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ.) ව්‍යාපෘතියේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා, විශේෂඥයින් සහ උපදේශකයින්ගේ කාර්යයන් අතර අන්තර් සම්බන්ධතාවයක් තිබිය යුතුය. කෙසේ වුවද, මෙම ව්‍යාපෘතිය | ව්‍යාපෘතිය යටතේ කොමිසම විසින් උපදේශකයින් දෙදෙනෙකු ලබාගෙන තිබුණි. මානව සම්පත් උපදේශක විසින් ආයුගණක උපදේශක සමග සාකච්ඡා කරන ලදී. එම නිසා දෙදෙනාම එකම කාල සීමාවකදී සේවය කර ඇත. | ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ කණ්ඩායමට නිසි |

| | | |
|---|---|---|
| සඳහා උපදේශකයින් වරින් වර බඳවා ගෙන තිබුණු අතර, ව්‍යාපෘතියේ පොදු අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා එම උපදේශකයින් අතර ප්‍රබල අන්තර් සම්බන්ධතාවක් පැවති බව නිරීක්ෂණය නොවීය. මෙම දුර්වල ව්‍යාපෘති කළමනාකරණය හේතුවෙන් අපේක්ෂිත ව්‍යාපෘති අරමුණු සහ ප්‍රතිඵල සාක්ෂාත් කර නොගෙන ව්‍යාපෘතිය අවසන් කර තිබුණි. | | සම්බන්ධීකරණයක් සහ සුදුසු ක්‍රියාමාර්ග තිබිය යුතුය. |
| (ඇ.) 2022 මාර්තු 29 දින සිට ක්‍රියාත්මක වන පරිදි ආයුගණක උපදේශකවරයා ඔහුගේ කොන්ත්‍රාත්තුව අවසන් කර තිබුණි. 2022 ජනවාරි 24 දිනට ආයුගණක උපදේශකවරයා විසින් පිළියෙළ කරන ලද "මේ දක්වා රක්ෂණ (ආයුගණක) ව්‍යාපෘතිය පිළිබඳ උපදේශකවරයාගේ තක්සේරුව" ලෙස නම් කර ඇති වාර්තාවට අනුව, කළමනාකාරීත්වය විසින් ආයුගණක උපදේශකවරයාගේ නිර්දේශ පිළිබඳ අදහස් දක්වා නොතිබීම, ක්‍රියාකාරී සැලසුම් ක්‍රියාත්මක කිරීමට සහ පසු විපරම් කිරීමට කොමිෂන් සභාව විසින් කිසිදු පියවරක් ගෙන නොතිබීම, සංරචක නායකයින් ඔහුගේ යෝජනාවලට සාධාරණ තර්ක සහිතව ප්‍රතිචාර නොදැක්වීම, මෙම ව්‍යාපෘතිය යටතේ බඳවා ගැනීම අවශ්‍ය වූ රක්‍ෂණ විශේෂඥයින්ගෙන් කිසිදු සහයෝගයක් ලබා ගැනීමෙන් තොරව ආයුගණක උපදේශකවරයාගේ කටයුතු කිරීමට සිදුවීම , රක්‍ෂණ සහ තොරතුරු තාක්‍ෂණ විශේෂඥයන් සැපයීමට කොමිෂන් සභාව බැඳී සිටි නමුත්, කොමිෂන් සභාව විසින් එසේ රක්‍ෂණ සහ තොරතුරු තාක්‍ෂණ විශේෂඥයන් සපයා නොතිබීම සහ නිසි පැහැදිලි කිරීම් ලබා නොදී ඔහුගේ උපදෙස් | ගිවිසුම අවසන් කර ඇත. කෙසේ වෙතත්, ආයුගණක උපදේශන සමාගම පත් කිරීමත් සමඟ එම වාර්තාවේ ඉදිරිපත් කරන ලද අදහස් සලකා බලනු ලැබේ. | කොමිෂන් සභාව විසින් ආයුගණක උපදේශක සමඟ ගිවිසුමේ නියමයන් ක්‍රියාත්මක කළ යුතු අතර එකඟ වූ කාර්යය ඉටු කර ගැනීම හෝ කොන්ත්‍රාත්තුවේ නියමයන් ක්‍රියාත්මක කිරීම සිදු කළ යුතුය. |

| | | |
|---|---|---|
| නොසලකා හැර තිබීම ඔහු විසින් මේ අන්දමින් කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට හේතු වී තිබුණි. ඉහත නිරීක්ෂණ මත පදනම්ව, ආයුගණක උපදේශකවරයා වෙත එ.ජ. ඩොලර් 168,000 ක් ගෙවා තිබීම ආර්ථික නොවන ගනුදෙනුවක් බව නිරීක්ෂණය වේ. | | |
| (ඇ) විගණනය සඳහා ලබා ගත හැකි වූ තොරතුරුවලට අනුව, ලබා දී ඇති වැඩ සැලැස්මට අනුව ආයුගණක උපදේශකවරයා විසින් සංරචක 3ක් සඳහා කිසිදු වාර්තාවක් නිකුත් කිරීම හෝ කාර්යයන් ඉටු කිරීම හෝ සිදු කර නොතිබුණි. එබැවින්, සංරචක 17 අතරින් සංරචක 14 ක් සඳහා අවසන් සහ කෙටුම්පත් වාර්තා ඉදිරිපත් කර තිබුණි. විගණනය සඳහා ලබා ගත හැකි වූ විස්තරවලට අනුව, එම වාර්තා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර නොතිබුණු අතර අදහස් දැක්වීම, සංවර්ධනය කිරීම සහ නියාමකයකු ලෙස ප්‍රතිපත්ති සැකසීම සම්බන්ධයෙන් වගකිව යුතු අදාළ පාර්ශ්ව සමඟ මෙම වාර්තා සම්බන්ධයෙන් සාකච්ඡා පවත්වා ඇති බවට කිසිදු සාක්ෂියක් නොමැත. | ගිවිසුම අවසන් කර ඇත. කෙසේ වෙතත්, ආයුගණක උපදේශන සමාගම පත් කිරීමත් සමඟ එම වාර්තාවේ ඉදිරිපත් කරන ලද අදහස් සලකා බලනු ලැබේ. | කොමිෂන් සභාව එකඟ වූ කාර්යය ආයුගණක උපදේශකවරයාගෙන් ලබා ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ඉ.) වැඩ සැලැස්මට අනුව, ආයුගණක උපදේශකවරයාගේ කාර්යය රක්ෂණ උපදේශක සහ තොරතුරු තාක්ෂණ උපදේශක වැනි වෙනත් උපදේශකයින් සමඟ සම්බන්ධ වී තිබුණි. එබැවින්, එම උපදේශකයින් අතර සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීමට කොමිෂන් සභාව විසින් ඔවුන් වෙත පහසුකම් සපයා නොමැති බව නිරීක්ෂණය විය. | ගිවිසුමේ / ප්‍රසම්පාදන සැලැස්මේ විධිවිධානවලට අනුව, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව ලැබෙන ආදායමෙන් කොටසක් උපදේශන සේවා සඳහා යෙදවීමට අදහස් කරන ලදී.<br><br>එම උපදේශන සේවා වූයේ::<br>I. ආයුගණනය පිළිබඳ ප්‍රවීණතාව<br>ii. රක්ෂණය පිළිබඳ ප්‍රවීණතාව<br>iii. තොරතුරු තාක්ෂණය පිළිබඳ ප්‍රවීණතාව<br>iv. මානව සම්පත් පිළිබඳ ප්‍රවීණතාව<br>v. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ නියාමන සහ අධීක්ෂණ රාමුව නවීකරණය කිරීම සඳහා වූ උපදේශන සමාගම. | ව්‍යාපෘති කළමනාකරණ කණ්ඩායම ව්‍යාපෘතියේ සාර්ථකත්වය සඳහා උපදේශකයින් අතර නිසි සම්බන්ධීකරණයක් සැලසිය යුතු අතර විගණනය සඳහා ඉල්ලා සිටින තොරතුරු ඉදිරිපත් කළ යුතුය. |
| (ඊ.) මානව සම්පත් උපදේශකවරයා වෙත පවරා ඇති කාර්යයට අනුව, උපදේශකවරයාගේ කාර්යය ඉටු කිරීමේදී සේවාලාභියාගේ අනාගත වර්ධනයන් පිළිබඳ අදහස් ලබා ගැනීම | | |

| | | |
|---|---|---|
| සඳහා උපදේශකවරයා විසින් ව්‍යාපෘතිය යටතේ සේවයෙහි යොදවන ලද අනෙකුත් උපදේශකවරුන් සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම උපදේශකවරයාට පැවරෙන අවසාන කාර්යය වේ. ව්‍යාපෘතියේ ප්‍රගතියට අනුව, ආයුගණක උපදේශකවරයා පමණක් පත් කර තිබුණි. මානව සම්පත් උපදේශකවරයාට මෙම ව්‍යාපෘතියේ අනෙකුත් උපදේශකවරුන් සම්බන්ධ කර ගැනීමට සහ සාකච්ඡා කිරීමට හැකි වූ බවට කිසිදු සාක්ෂියක් නොමැත. එබැවින්, උපදේශකවරුන් අතර නිසි සම්බන්ධීකරණයක් සහ සන්නිවේදනයක් නොමැතිකම හේතුවෙන් ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ප්‍රතිඵල අත්පත් කර ගැනීමට නොහැකි වනු ඇත. | කෙසේ වෙතත්, කොමිසමේ පාලනයෙන් බැහැර හේතු නිසා, වෙනත් උපදේශකයින් අතර සම්බන්ධීකරණය සඳහා එවැනි උපදේශකයින්ට පහසුකම් සැලසීම සඳහා උපදේශක රක්ෂණ සහ උපදේශක තොරතුරු තාක්ෂණ ලබා ගැනීමට නොහැකි විය. මානව සම්පත් උපදේශක හා ආයුගණක උපදේශක දෙදෙනාම කොමිසම වෙත එකම කාල පරිච්ඡේදයකදී සේවය කළ බැවින් දෙදෙනා සාකච්ඡා කර ඇත.<br>නිසි සම්බන්ධීකරණයට අවශ්‍ය පහසුකම් සපයන ලදී. තවද ගිවිසුමට අනුව කොමිසමේ සිත වැඩ කිරීමට ආයුගණක උපදේශක අසමත් විය. | |

## 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ.) නීතිපතිවරයාගේ මතය මත පදනම් වෙමින් කොමිෂන් සභාව විසින් සේවක සංඛ්‍යාව සහ වැටුප් ක්‍රමය ඔවුන් විසින්ම තීරණය කර තිබුණි . අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් 2019 මැයි 31 දිනැති සංදේශය මගින්, 2018 ජූලි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි, කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය සඳහා වැටුප් ගැළපීම් සිදු කිරීම, සේවක මණ්ඩල සංශෝධනය, රු.7,800 ක් වන ජීවන වියදම් දීමනාව ගෙවීම, මූලික වැටුපෙන් 15% ක නිපුණතා දීමනාවක් සහ රු. 12,500 ක විශේෂ ජීවන වියදම් දීමනාවක් ගෙවීම සඳහා සභාපතිවරයාගේ අනුමැතිය ඉල්ලා තිබුණි. කොමිෂන් සභාව මුදල් අමාත්‍යාංශයේ විෂය පථය යටතේ පවතින ආයතනයක් වුවද, කොමිෂන් | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ පාරිශ්‍රමික සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් පත් කරන ලද කමිටුව විසින් පසුගිය වසර 13 අතරින්, 2012 වර්ෂයේ දී පමණක් එක් වැටුප් සංශෝධනයක් ලබා දී ඇති බවත්, එබැවින් කාර්ය මණ්ඩල වැටුප් වෙළඳපොළ අනුපාත සමඟ සැසඳිය නොහැකි බවත්, විශේෂයෙන්ම මූල්‍ය අංශයේ අනෙකුත් නියාමකයින් විසින් පිරිනමනු ලබන පාරිශ්‍රමික සමඟ කාර්ය මණ්ඩල වැටුප් සැසඳිය නොහැකි බවත් සඳහන් කරන ලදී.<br><br>මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, විමර්ශන, ඒකාබද්ධ කිරීම් සහ පවරා ගැනීම් යන සන්දර්භය තුළ රක්ෂණ ක්ෂේත්‍රයේ දිනෙන් දින ඉහළ යන සංකීර්ණ අභියෝගවලට මුහුණ දීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවට සුදුසුකම් ලත් සහ පළපුරුදු කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීමටත්, දැනට සිටින සුදුසුකම් ලත් සහ පළපුරුදු කාර්ය මණ්ඩලය රඳවා තබා ගැනීමටත් කොමිෂන් සභාවට නොහැකි වී | කොමිෂන් සභාව ඔවුන්ගේ සේවක තනතුරු සහ වැටුප් ව්‍යුහය සඳහා මුදල් අමාත්‍යාංශයෙන් අනුමැතිය ලබා ගත යුතුය. |

| | | |
|---|---|---|
| සභාව විසින් එහි සේවක සංඛ්‍යාව තීරණය කිරීමට සහ වැටුප් හා දීමනා වැඩි කිරීමට මහා භාණ්ඩාගාරයෙන් නිෂ්කාශනය හෝ එකඟතාවය ලබාගෙන නොතිබුණි.<br>(ආ.) 2018 ජූලි 18 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ 03/2018 හා යහපාලන මාර්ගෝපදේශයට පටහැනිව, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය ලබා නොගෙන, නීතිපතිවරයාගේ මතය මත පදනම්ව, 2019 වර්ෂයේ දී කොමිෂන් සභාවේ වැටුප් 12.98% සිට 59.73% දක්වා ඉහළ නංවා තිබුණි . | ඇත.  නියාමකයාගේ ඵලදායිතාව, කාර්යක්ෂමතාව සහ අදාළතාව ඉහළ නැංවීම සඳහා ජාත්‍යන්තර රක්ෂණ පිළිවෙත්වලට අනුකූල වීම සඳහා වත්මන් රාමුව වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාවය ද පවතී . තවද, අනෙකුත් නියාමකයින් මෙන්ම, මනා වැටුප් ක්‍රමවේදයක් සම්බන්ධ පහත කරුණු ඉස්මතු කිරීමට අපි අපේක්ෂා කරමු. ශ්‍රී ලංකා රක්‍ෂණ නියාමන කොමිෂන් සභාවේ සෑම තනතුරක් සඳහාම බඳවා ගැනීම් සිදු කරනු ලබන්නේ පිළිගත් ආයතනවල කලින් වැඩ කිරීමෙන් ලබා ගත් පළපුරුද්දට අනුව වන අතර සියලුම විධායක සහ සහකාර කළමනාකරු තනතුරු සහ ඒවාට ඉහළ කාර්ය මණ්ඩල තනතුරු සඳහා යෝග්‍ය සුදුසුකම් ලබා තිබිය යුතුය.<br><br>2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්ත නියාමන පනතේ 10 වැනි වගන්තියේ මෙසේ සඳහන් වේ :<br>"කොමිෂන් සභාව විසින් තම කාර්ය සාධනය කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා අවශ්‍ය යැයි සලකන නිලධාරීන් පත් කළ හැකි අතර, එසේ පත් කරන නිලධාරීන්ට එම ක්‍රමයට සහ එම මිල ගණන් යටතේ වැටුප් ගෙවිය යුතු අතර කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන සේවා කොන්දේසිවලට යටත් විය යුතුය."  ව්‍යවස්ථාපිත අධිකාරියට අනුව, කොමිසම  PED 01/2021 හි ඇමුණුම A හි ලැයිස්තුගත කර ඇති ආයතනයක් ලෙස වර්ග කළ හැක. ඒ අනුව, කොමිෂන් සභාව PED 01/2021 ප්‍රකාරව මුදල් අමාත්‍යාංශයට ලියනු ඇත.<br><br>කොමිසමේ නිලධාරීන් මේ සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශ නිලධාරීන් සමඟ සාකච්ඡා කර ඇත . | |
| (ඇ.) 2010 වර්ෂයේ සිට මහා භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව කාර්යසාධන දිරි දීමනාවක් ගෙවා තිබුණි. මෙම යෝජනා ක්‍රමයට අනුව 2019 වර්ෂයේ සිට මහා භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව මාස එකක (01) මූලික වැටුප දිරි දීමනා ගෙවීමේ පදනම මාස එකහමාරක (1 ½) දළ වැටුප දක්වා වෙනස් කර ඇත.  මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාළ මුළු දිරි දීමනාව රු. 4,605,381 ක් වූ අතර එය පෙර | දැනට පවතින කාර්යසාධන ඇගැයීමේ ක්‍රමය විවිධ කාර්යසාධන ඇගැයීම් ක්‍රම පරීක්ෂා කිරීමෙන් පසුව ක්‍රියාත්මක කර ඇති අතර සේවකයාගේ කාර්යසාධනය විවිධ පැතිකඩ මගින් ආවරණය කර ඇත.<br><br>කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරන ලද කාර්ය සාධනය මත පදනම් වූ දිරිගැන්වීමේ යෝජනා ක්‍රමය වසර ගණනාවක් පුරා මුදල් අමාත්‍යාංශය වෙත අප විසින් ඉදිරිපත් කර ඇත.  කොමිසම විසින් කාර්ය සාධන දිරිගැන්වීමේ යෝජනා ක්‍රමය සහ එහි සිදු කරන ලද සියලුම සංශෝධන කලින් කලට මුදල් අමාත්‍යාංශය සමග හුවමාරු කර ගෙන ඇත.  කෙසේ | කාර්ය සාධන දිරිගැන්වීමේ යෝජනා ක්‍රමය සඳහා කොමිෂන් සභාව මහා භාණ්ඩාගාරයෙන් පූර්ව අනුමැතිය ලබා ගත යුතුය. |

| | | |
|---|---|---|
| වසරට සාපේක්ෂව සියයට 105 ක වැඩිවීමකි. තවද, අවසාන ඇගයීම සඳහා සියලුම සේවකයින් සියයට සියයක් ලකුණු ලබා ගෙන තිබුණි. එබැවින් කොමිසම මගින් යථාර්ථවාදී කාර්ය සාධන ඇගයීමක් සිදු කර ඇති බවක් නොපෙනේ . | වෙතත්, PED 01/2021 ප්‍රකාරව ක්‍රියා කර නව කාර්යසාධන ඇගයීම් ක්‍රමය 2023 මාර්තු 31 දින අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලදී .<br><br>කොමිෂන් සභාව එහි 195 වන රැස්වීමේදී IRCSL හි කාර්යමණ්ඩලයේ කාර්ය සාධනය පදනම් කරගත් දිරිගැන්වීමක් ලෙස උපරිම වශයෙන් මාස 1.5 ක දළ වැටුපක් ගෙවීමට අනුමැතිය ලබා දෙන ලදී. කොමිෂන් සභා තීරණය මත ගෙවීම් සිදු කර ඇත.<br>කොමිසම විසින් නව කාර්ය සාධන ඇගයීම් යෝජනා ක්‍රමය 2023 මාර්තු 31 දින රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලදී. එම දෙපාර්තමේන්තුව විසින් ඉල්ලා ඇති වැඩිදුර විස්තර 2023 ඔක්තෝබර් 10 දින යොමු කරන ලදී. | |
| (ඇ.) 2018 ජුලි 18 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 03/2018 සහ රාජ්‍ය ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතේ 3 වැනි වගන්තියට අනුව මහා භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතිය ලබා නොගෙන සියලුම අමාත්‍යාංශ සහ අනෙකුත් අදාළ බලධාරීන් සේවකයන් බඳවා ගැනීමෙන් හා වැටුප් හා සේවක සංඛ්‍යාව ඉහළ නැංවීමෙන් වැළකී සිටිය යුතු බවට උපදෙස් දී ඇත. කෙසේ වෙතත්, මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව එක් (01) අධ්‍යක්ෂ තනතුරක්, කළමනාකරුවන්/සහායක කළමනාකරුවන් දහතුනක් (13) ක් සහ එක් (01) ලේකම් තනතුරක් පුරවා ඇත . | කොමිෂන් සභාව තනතුරු 57ක් සඳහා මුදල් අමාත්‍යාංශයෙන් අනුමැතිය ලබාගෙන ඇත. කොමිසමේ සියලුම නව බඳවා ගැනීම් මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය මත සිදු වේ .<br><br>2023 ජුලි 05 වැනි දින PED 01/2021 ප්‍රකාරව මුළු සේවක සංඛ්‍යාවට බලපෑමක් නොවන උසස් වීම් ශ්‍රේණිවලට අදාළ සේවකයින් පිළිබඳව මුදල් අමාත්‍යාංශයට ලියා ඇත.<br><br>කොමිසමේ නිලධාරීන් මේ සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශ නිලධාරීන් සමඟ සාකච්ඡා කර ඇත . | කොමිෂන් සභාව වැටුප් හා සේවක සංඛ්‍යා සංශෝධන සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුය . |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වැනි වගන්තියට අනුව, සෑම විගණිත ආයතනයකටම තමන්ගේම අභ්‍යන්තර විගණකවරයකු සිටිය යුතු අතර, | 2023 – 2025 වසර සඳහා අභ්‍යන්තර විගණකවරයෙකු පත් කර ඇත. | කොමිෂන් සභාව වහාම කොමිෂන් සභාව සඳහා අභ්‍යන්තර |

| | | |
|---|---|---|
| ඔහු එවැනි විගණන ආයතනයක පාලක මණ්ඩලය විසින් නිසි පරිදි පත් කරන ලද අභ්‍යන්තර විගණනයක් කළ යුතුය. පළමුවන උපවගන්තිය යටතේ අභ්‍යන්තර විගණකවරයෙකු පත් කර නොමැති නම්, මෙම පනත ක්‍රියාත්මක වූ දින සිට වසර දෙකක් නොඉක්මවන කාල සීමාවක් තුළ එම පත් කිරීම සිදු කළ යුතුය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය සඳහා කොමිෂන් සභාව විසින් අභ්‍යන්තර විගණකවරයෙකු පත් කර නොතිබුණි. | | විගණකවරයෙකු පත් කළ යුතුය. |

**4.2 විගණන කමිටුව**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ.) 2021 රාජ්‍ය ව්‍යවසායන් සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශවල මාර්ගෝපදේශ 4.2 (d.) අනුව, රේඛීය අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක (CIA) විගණන කමිටුවේ නිරීක්ෂකයකු ලෙස කටයුතු කළ හැකිය. කෙසේ වෙතත්, 2022 වර්ෂය සඳහා විගණන කමිටුව සඳහා රේඛීය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණක වෙත ආරාධනා කර නොතිබුණි. | අභ්‍යන්තර විගණකවරයෙකුගේ සේවය ලබා ගැනීමක් ලෙස විගණන කමිටු රැස්වීම් සඳහා ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයාට ආරාධනා කිරීමේ අවශ්‍යතාවයක් මේ මොහොතේ මතුව නොමැති බව කමිටුව නිරීක්ෂණය කළේය. තවද, අදහස් දැක්වීම යෝජනාවක් පමණක් වන අතර, ඒ සඳහා අමතර වියදම් දැරීමට සිදුවන බැවින්, මෙම අදහස් දැක්වීම මේ මොහොතේ සලකා බැලීම අවශ්‍ය නොවන බව කමිටුවේ අදහසයි. | කොමිෂන් සභාව මාර්ගෝපදේශයේ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ආ.) 2021 රාජ්‍ය සතු ව්‍යවසායන් සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශවල 4.2(h.) මාර්ගෝපදේශයට අනුව, විගණන කමිටුව (AC) අවම වශයෙන් මාස තුනකට වරක් රැස්විය යුතුය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය පුරාවට කොමිෂන් සභාව විසින් විගණන කමිටු නිතිපතා පවත්වා නොමැති බව නිරීක්ෂණය විය. මෙය ප්‍රධාන වශයෙන් මාර්ගෝපදේශයේ 2.6 වගන්තිය අනුව අවශ්‍ය සුදුසුකම් සහිත අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයෙකු නොමැති වීම හේතුවෙන් සිදුව ඇති බව නිරීක්ෂණය විය. | විගණන කමිටු රැස්වීම් ඒ සඳහා සාමාජිකයින් පත් කිරීමෙන් පසු කාර්තුමය පදනමින් පවත්වනු ලැබේ. | කොමිෂන් සභාව විසින් විගණන කමිටු රැස්වීම් කාලානුරූපව හා ඵලදායී ලෙස පැවැත්විය යුතුය. |